# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2164/13 - 2020 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2020.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**7 වන සංශෝධනය**

ශ්‍රී ලංකා හෙද සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 2087/75 හා 2018 සැප්තැම්බර් 07 දිනැති, අංක 2086/3 හා 2018 අගෝස්තු 27 දිනැති, අංක 2022/18 හා 2017 ජුනි 07 දිනැති, අංක 1986/10, 2016 සැප්තැම්බර් 27 දිනැති, අංක 1966/23 හා 2016 මැයි 11 සහ අංක 1881/14 හා 2014 සැප්තැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* මඟින් සංශෝධිත අංක 1837/8 හා 2013 නොවැම්බර් 19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. එම්. හද්‍රානි ජයවර්ධන,  
ලේකම්,  
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 25 වැනි දින,  
කොළඹ 10,  
අංක 385,  
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,  
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ දීය.


1A - G 32086 — 18 (2020/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**20. අන්තර්කාලීන විධිවිධාන**

අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/19/0672/112/040-1 හා 2019.07.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලද අනුමැතිය අනුව අන්තර්කාලය 2015.12.31 දින සිට 2020.12.31 දක්වා දීර්ඝ කරනු ලැබේ.2021.01.01 දින සිට නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ.

**20.2.2. III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම**

2014.09.04 දින හෝ ඊට පෙර III වන ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරට පත් කරන ලද හෙද නිලධාරීන් අතුරින් අන්තර්කාලය තුළදී III ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලයක් සපුරාලන හා පැරණි හෙද සේවා ව්‍යවස්ථාව අනුව අවශ්‍ය අනෙකුත් සියලුම සුදුසුකම් සපුරාලන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. අන්තර්කාලය ඉක්ම ගිය පසු සුදුසුකම් සපුරාලන නිලධාරීන්ට උසස්වීම් ලබා දෙනුයේ නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලවය. මෙහිදී පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ වූ II (ආ) ඛණ්ඩයේ සේවා කාලය නව හෙද සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.

03 - 237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.